# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,451 - 2025 අගෝස්තු මස 22 වැනි සිකුරාදා - 2025.08.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබැර්තු ... ... | 1072 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — | අයවැය ලේඛන ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1076 | දේපළ විකිණීම් ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | විවිධ දැන්වීම් ... ... | 1011 |



**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1071 - B 082713 — 5,403 (2025/08)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## නාවලපිටිය නගර සභාව

නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම

නාවලපිටිය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට මධ්‍යම පළාත් පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| රියදුරු (දෛනික) | 04 |

**බඳවා ගැනීමේ සුදුසුකම් :**

01.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය (දෛනික පදනම මත)

01.2 **සුදුසුකම් :**

01.2.1 **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

01.2.2 **වෘත්තීය සුදුසුකම්** : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම

| *තනතුරු නාමය* | *සම්පූර්ණ කළ යුතු සුදුසුකම්* |
|---|---|
| රියදුරු | තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ටේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03 කට පෙර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද 'ඒ' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.) |

01.2.3 **පළපුරුද්ද:**

මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

01.2.4 **කායික සුදුසුකම් :**

I. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.

01.2.5 **වෙනත්:**

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ පදිංචිකරුවන් විය යුතුය. වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි.

III. මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත වියයුතුය.

IV. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්න කර තිබිය යුතුය.

V. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍ර දේශයක වුවද සේවය කිරිමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

01.3 **වයස :**

01.3.1 අවම වයස් සීමාව : අවුරුදු 18 යි

01.3.2 උපරිම වයස් සීමාව: අවුරුදු 45 යි

01.4 **බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

01.4.1 **ලිඛිත විභාගය :** පහත සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ

**පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය :**

1. විභාගය පිළිබඳ විස්තර :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 20% |

2. මෙම පරීක්ෂණය නාවලපිටිය නගර සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.
3. තරඟ විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුත වේ.
4. සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු වේ.
5. විභාගය සඳහා විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි. |

01.4.2 **වෘත්තීය පරීක්ෂණය**

| | *පරීක්ෂා කර ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. | රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. | මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | | 100 | |

01.5 **අයදුම් කළ යුතු ආකාරය :**

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12 x 8 ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර **"නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහාා දෛනික වැටුප් මත බඳවා ගැනීම"** ලෙස අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා **2025.09.12** වැනි දිනට පෙර **ලේකම්, නගර සභා, නාවලපිටිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ**. අයදුම්පත් සමඟ පහත ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. හැඳුනුම්පතේ ඡායා පිටපතක්
4. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී සහතිකය
5. මෑතකදී ගත් චරිත සහතික 02 ක්
6. වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතික
7. පොලිස් වාර්තාව

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නාවලපිටිය නගර සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ අනුවාදනයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනය අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

ලේකම්,
නගර සභාව,
නාවලපිටිය.

2025 අගෝස්තු මස 22 වැනි දින,
නාවලපිටිය නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**නාවලපිටිය නගර සභාවේ රියදුරු තනතුර (දෛනික වැටුප් මත) සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය**

1. මුලකුරු සමඟ නම :……………………………………………………………………………………………
2. සම්පූර්න නම :…………………………………………………………………………………………………
3. ජාතික හැඳුනුම්පත් අංකය :……………………………………………………………………………………
4. උපන් දිනය : වර්ෂය :……………… මාසය :……………… දිනය:………………
5. අයදුම්පත් භාර ගන්නා දිනට වයස : අවුරුදු :……………… මාස :……………… දින :………………
6. ස්ත්‍රී/පුරුෂ භාවය :………………………………
7. විවාහක/අවිවාහක බව :…………………………

8. ජාතිය :……………………………
9. ස්ථිර ලිපිනය :…………………………………………………………………………………………
10. දුරකථන අංකය :……………………………
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව :…………………………………

අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

*පළමු වතාව*
වර්ෂය හා මාසය :……………………………
විභාග අංකය :……………………………

*දෙවන වතාව*
වර්ෂය හා මාසය :……………………………
විභාග අංකය :……………………………

12. **අධ්‍යාපන සුදුසුකම් :**

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 1 | |
| 2 | | 2 | |
| 3 | | 3 | |
| 4 | | 4 | |
| 5 | | 5 | |
| 6 | | 6 | |
| 7 | | 7 | |
| 8 | | 8 | |

13. වෘත්තීය සුදුසුකම් :…………………………………………………………………………………………
…………………………………………………………………………………………………………

14. පළපුරුද්ද :…………………………………………………………………………………………
…………………………………………………………………………………………………………

මෙම අයදුම් පත්‍ර යේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දන්වමි.

………………………
අයදුම්කරුගේ අත්සන.

දිනය :………………………

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන……………………………………………………………… මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක වශයෙන් සේවය කරන බව සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව කාරුණිකව දන්වමි.

…………………………………
දෙපාර්මේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :…………………

08-291

# පළාත් පාලන නිවේදන

## මාතර මහා නගර සභාව

### 2025 මාතර අප ස්වාමි දුවගේ සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා මාර්ග වසා තැබීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහ නගර සභා ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව, 2017 මාර්තු 03 දිනැති අංක 2009 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර ප්‍රසිද්ධියට පත්කර, මාතර මහා නගර සභාව විසින් වැළඳගන්නා ලද, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් කෙටුම්පත් කර ප්‍රසිද්ධියට පත් කරන ලද අංක 1811 හා 2013 මැයි මස 17 වන දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ "වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ" 2 වගන්තිය ප්‍රකාරව,

මාතර අප ස්වාමි දුවගේ සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය පැවැත්වෙන 2025 සැප්තැම්බර් මස 12 දින මධ්‍යාහ්න 12.00 න් පසු සර්වේශස් මාවතේ වාහන නවතා නොතැබීමත්, වෙරළ පාර (සිද්ධස්ථාන භූමියේ සිට මහාමායා මාවත දක්වා) සහ මහාමායා මාවත සවස 2.30 පසුත් වාහන නවතා නොතැබීමත්, වෙරළ පාර/මහාමායා මාවත/අලුත් තංගල්ල පාර/සර්වේශස් මාවත යන මාර්ගයන් සවස 04 න් පසු පෙරහැර ගමන් කිරීමට රථ වාහන ධාවනය වලකාලමින් වසා තැබීමටත්, සැප්තැම්බර් මස 13 වැනි දින දහවල් 12.00 න් පසු අරලිය මාවතේ වාහන නවතා නොතැබීමටත්, වෙරළ පාර සැප්තැම්බර් 13 සෙනසුරාදා දහවල් 12.00 සිට සැප්තැම්බර් මස 14 ඉරිදා සවස 2.00 දක්වා සම්පූර්ණයෙන්ම වසා තැබීමටත්, අරලිය මාවත/අලුත් තංගල්ල පාර/එස්. කේ. හන්දිය සිට වෙරළ පාර දෙසට 13 වැනි සෙනසුරාදා සවස 5න් පසුව පෙරහැර ගමන් කිරීම නිසා රථ වාහන ධාවනය වලකාලමින් වසා තබනු ලබන බව මෙයින් නිවේදනය කර ප්‍රසිද්ධ කරමි.

ජයන්ත කේ. එස්. පතිරණ,<br>
නගරාධිපති,<br>
මාතර මහා නගර සභාව.

2025 අගෝස්තු මස 13 වැනි දින,<br>
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

08-252

---

## අරණායක ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ විරෝධතා කැඳවීමේ දැන්වීම

1989 අංක 12 දරන (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා දී ඇති CLG/LG-5/5/2/2 අංක දරන 2025.05.30 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග අරණායක ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශ්වයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස තුනක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙ හි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. පී. මංජුල සෙනවිරත්න,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව,<br>
අරණායක.

2025 අගෝස්තු මස 06 වැනි දින,<br>
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | බොරැල්ලේහේන මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | - | අත්තනගොඩ දොඩන්තලේ ප්‍රධාන මාර්ගය |
| මාර්ගයේ අවසානය | - | මඩොල්ගහමුල වත්ත දක්වා |
| ග්‍රාම නිලධාරි වසම | - | 15ඒ, කන්දේවත්ත, 15ඒ, උඩුවේවල වසම |
| මාර්ගයේ දිග හා පළල | - | දිග - මීටර් 24.50 පළල - අඩි 08 |
| | | දිග - මීටර් 222.00 පළල - අඩි 10 |


**මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් :**

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| 01. කේ. එල් එස්. මල්කාන්ති සෝමරත්න මිය | ඉදිගොල්ලේහේන දැනට වත්ත |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :**

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| 01. ආර්. පී. පුෂ්පා අයිරාංගනී මිය | රන්හොටිපේඩිගේවත්ත *නොහොත්* බොරැල්ලේහේන |
| 02. ආර්. පී. සමරසිංහ මයා | රන්හොටිපේඩිගේවත්ත *නොහොත්* බොරැල්ලේහේන |
| 03. එච්. තිලකරත්න මයා | රන්හොටිපේඩිගේවත්ත *නොහොත්* බොරැල්ලේහේන |
| 04. ආර්. පී. සමරසිංහ මයා | රන්හොටිපේඩිගේවත්ත *නොහොත්* බොරැල්ලේහේන |
| 05. ආර්. පී. කරුණාරත්න මයා | රන්හොටිපේඩිගේවත්ත *නොහොත්* බොරැල්ලේහේන |
| 06. ආර්. පී. සුමනදාස මයා | රන්හොටිපේඩිගේවත්ත *නොහොත්* බොරැල්ලේහේන |
| 07. ආර්. පී. නන්දන විජයබණ්ඩාර මයා | රන්හොටිපේඩිගේවත්ත *නොහොත්* බොරැල්ලේහේන |
| 08. කේ. එල්. එස්. මල්කාන්ති සෝමරත්න මිය | රන්හොටිපේඩිගේවත්ත *නොහොත්* බොරැල්ලේහේන |
| 09. කේ. එල්. එස්. මල්කාන්ති සෝමරත්න මිය | ගෙදරගාවාහේන |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2024.12.17 දින මනින ලද පිඹුරුපත් අංක 1666 දරන පිඹුරුපත අනුව වේ.




| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0051 | 00 | 0 | 02.01 | 24.50 | 08.00 | අඩි 10 දක්වා පළල් කිරීම සඳහා යාබද ඉඩමේ හිමිකරු වන ආර්.පී.පුෂ්පා අයිරංගනී යන අයගේ කැමැත්ත ගත යුතුව ඇත |
| 2 | 0.0686 | 00 | 0 | 27.12 | 222.00 | 10.00 | |
| එකතුව | 0.0737 | 00 | 0 | 29.12 | 246.50 | | |

මනින ලද්දේ : 2024.12.08 වන දින

2024 - 12 - 17

එච්. එම්. ආර්. ටී. කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයබිම මාවත
දලුග්ගල, රඹුක්කන
035-2266422 /077 4973610

**මීගමුව මහා නගර සභාව**

ගෝසාතක ආඥාපනත (272) වන අධිකාරිය යටතේ විරෝධතා කැඳවීම

මීගමුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස්, නුවනි සුදුසිංහ වන මම මහා නගර සභා ආඥාපනතේ 286(අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂය සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයෙහි එළු මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බැවින්, එම බලපත්‍රය ලබා දීම පිණිස මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත්වන අයවළුන් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දා සිට, දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් නාගරික කොමසාරිස් නමට එවිය යුතු බව ගෝසාතක ආඥාපනතේ (272) වන අධිකාරිය 7(2) වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

නුවනි සුදුසිංහ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.

2025 අගෝස්තු මස 18 වැනි දින,
මීගමුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ නම | - | මොහමදු අවුල් මුහම්මදු සෆ්රාස් |
| මස් වෙළඳාම පවත්වාගෙන යාමට යෝජිත ස්ථානය | - | අංක 243/ඵල පෝරුතොට, කොච්චිකඩේ |
| වෙළඳාමේ ස්වභාවය | - | එළුමස් වෙළඳාම |

08-280

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.